**ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය - 2018**

**------------------------------------------------**

## 1.1 මතය ප්‍රකාශ කිරීම

**--------------------**

ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, සමුච්චිත අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ප්‍රකාශ කිරීම සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.2 මතය ප්‍රකාශ කිරීම සඳහා පදනම

**-----------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ප්‍රකාශ කිරීම කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සම්මේලනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සම්මේලනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සම්මේලනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සම්මේලනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සම්මේලනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ප්‍රමිතියේ පරිච්ඡේද 17 හි 8 වන වගන්තිය ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලි එකවර අත්පත් කර ගත්තද ඒවා වෙන් වෙන් වශයෙන් ගිණුම් ගත කළ යුතු වුවත් සම්මේලනය විසින් රු.71,242,177 ක් වූ ගොඩනැගිලි ගිණුම්ගත කර තිබුණද එම එම ගොඩනැගිලි පිහිටි ඉඩම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) ප්‍රමිතියේ පරිච්ඡේද 17 හි 19 වගන්තිය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.3,120,012 ක් වූ යන්ත්‍ර හා උපකරණ සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇස්තමේන්තුගත දෝෂය ප්‍රමිතියේ පරිච්ඡේද 10 හි 18 ඡේදය ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2019 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව ක්‍රියා කළ යුතුය. |
| (ඇ) ඉකුත් වර්ෂ වලට අදාළව ගිණුම්ගත නොවූ දේපල පිරියත හා උපකරණ ක්ෂය රු.6,746,807 ක් මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කර තිබුණද ඒ සම්බන්ධයෙන් ප්‍රමිතියේ පරිච්ඡේද 10 හි 23 වගන්තිය ප්‍රකාරව හෙළිදරව් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොමැති වීම පිළිගනිමි. | -එම- |

| | | |
|---|---|---|
| (ඈ) වටිනාකම රු.5,600,000 ක් වූ කල්බදු පදනම යටතේ ලබා ගෙන තිබුණු මෝටර් වැන් රථය ප්‍රමිතියේ පරිච්ඡේද 20 හි 13 වගන්තිය ප්‍රකාරව කල්බදු වත්කම් ලෙස දක්වා නොතිබුණු අතර නිදහස් දේපල යටතේ මෝටර් වාහන වල ඇතුළත් කර තිබුණි. | අදාළ වත්කම් කල්බදු වත්කම් යටතේ දක්වා නොමැති අතර ජංගම නොවන වත්කම්වල ප්‍රකාශ කර ඇත. | ප්‍රමිතියේ දක්වා ඇති පරිදි කල්බදු දේපල වෙනම මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කළ යුතුය. |
| (ඉ) වටිනාකම රු.5,899,457 ක් වූ විශ්‍රාම ප්‍රතිලාභ මූල්‍ය ප්‍රකාශනවල වගකීමක් ලෙස දක්වා තිබුණද ප්‍රමිතියේ පරිච්ඡේද 28 හි 15 වගන්තිය ප්‍රකාරව විශ්‍රාම ප්‍රතිලාභ වගකීමෙහි වර්තමාන වටිනාකම හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2019 මූල්‍ය වර්ෂයේදී විශ්‍රාම ප්‍රතිලාභ වගකීමෙහි වර්තමාන වටිනාකම ගණනය කිරීම සඳහා සුදුසුකම් ඇති තක්සේරුකරුවෙකු පත්කිරීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇත. | ගෙවිය යුතු විශ්‍රාම ප්‍රතිලාභ වගකීම වර්තමාන වටිනාකම මත මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) සමාලෝචිත වර්ෂය තුළදී සම්මේලනය විසින් වැයකර තිබුණු රු.1,676,966 ක් වූ නීති වියදම් සම්බන්ධයෙන් ප්‍රමිතියේ පරිච්ඡේද 8 හි 4 වන වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රමිතියේ නියමයන්ට අනුව මෙම වියදම පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සම්මේලනයේ හිටපු මුදල් කළමනාකරු විසින් තරඟ විනිසුරුවන් ලෙස ව්‍යාජ නම් ඇතුළත් කර මුදල් ලබාගෙන ඇති බව 2017 වර්ෂයේදී සම්මේලනය විසින් කරන ලද පරීක්ෂණවලදී අනාවරණය වී තිබුණි. මෙම මුදල් වංචාව සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වැඩිදුර පරීක්ෂණ පවත්වන අතර වංචාකරන ලද මුළු මුදල් ප්‍රමාණය සමාලෝචිත වර්ෂයේදී ද අනාවරණය කර ගැනීමට නොහැකි වී තිබුණි. මේ පිළිබඳව ඉකුත් වර්ෂයේ විගණකාධිපති වාර්තාව මගින් පෙන්වා දී තිබුණද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හඳුනා නොගත් අරමුදල් මාරු කිරීම් ලෙස රු.14,525,389 ක් ලැබිය යුතු ගිණුම් යටතේ දක්වා තිබුණි. මෙම තත්ත්වය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | අදාළ නඩු කටයුතු සිදුවෙමින් පවතී. 2017 වර්ෂයේ මූල්‍ය වාර්තාවල වංචා කරන ලද මුදල වශයෙන් රු.14,525,389 දක්වා ඇත. | වංචා කරන ලද මුදල් ප්‍රමාණය අප්‍රමාදව හඳුනාගෙන නිවැරදි ලෙස ගිණුම් ගත කිරීම සහ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට ක්‍රියා කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) පළාත් පාලන ආයතන සමග ඇතිකරගෙන තිබුණු අවබෝධතා ගිවිසුම් මත සම්මේලනය විසින් භාවිතයට ගනු ලබන පළාත් පාලන ආයතන වලට අයත් ක්‍රීඩාපිටිවල සංවර්ධන කටයුතු සඳහා ජාත්‍යන්තර පාපන්දු සම්මේලනය මගින් සෘජුවම දේශීය හා විදේශීය කොන්ත්‍රාත්කරුවන් ලවා කරන ලද ඉදිකිරීම්වල වටිනාකම කල්බදු වත්කම් යටතේ වැරදි ලෙස ගිණුම්ගත කර තිබුණු අතර ඒ මත විලම්භිත අයභාර බැරකම් වශයෙන් රු.137,994,358 ක් මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වගකීම් යටතේ දක්වා තිබුණි. මේ සම්බන්ධයෙන් 2016 හා 2017 වර්ෂවල විගණකාධිපති වාර්තා මගින් පෙන්වා දී තිබුණද නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳව අවසාන තිරණය ගැනීම 2019 මූල්‍ය වර්ෂය තෙක් කල්තබා ඇත. තවද ජංගම නොවන වත්කම් ප්‍රත්‍යාගණනයේදි මෙම අගය වඩාත් නිවැරදි ලෙස තහවුරු කර ගැනීමට කටයුතු කරන බව දැනුම් දෙමු. | නිවැරදි ලෙස ගිණුම් ගත කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ඇ) 2018 දෙසැම්බර් 31 දිනට රු.2,100,200 ක් වූ කල්බදු යටතේ ලබාගත් ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩම 2015 වර්ෂයේ සිට හා රු.5,306,765 ක් වූ යාපනයේ කල්බදු ක්‍රීඩා සංකීර්ණය 2011 වර්ෂයේ සිට ක්‍රමක්ෂය සිදුකර නොතිබුණි. | 2019 වර්ෂයේදී ජංගම නොවන වත්කම් ප්‍රත්‍යාගණනය සිදු කිරීමට නියමිත අතර එයට සමගාමීව මේ පිළිබඳව අවධානය යොමු කරනු ඇත. | කල්බදු වත්කම් ක්‍රමක්ෂය කළ යු.තුය. |
| (ඇ) වර්ෂ 30 ක කාලයක් සඳහා කල්බදු පදනම මත ලබා ගෙන තිබුණු ගම්පහ, නෝවුඩ් සහ අම්පාර ප්‍රදේශ වල පිහිටි ක්‍රීඩා සංකීර්ණ 03 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ කල්බදු වත්කම් යටතේ දක්වා නොතිබුණි. | -එම- | මෙම කල්බදු වත්කම් අගය කර ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) 2016 වර්ෂයේ සිට පැවත එන රු.724,201 ක් වූ කලින් ගෙවීම් ශේෂ 03 ක් නිරවුල් කිරීමකින් තොරව ලැබිය යුතු ගිණුම් යටතේ දක්වා තිබුණි. | 2019 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | කලින් ගෙවීම් අප්‍රමාදව ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.3 විගණන සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

පහත සඳහන් ගිණුම් විෂයයන්ට අදාළව ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට හෝ නොහැකි විය.

| විෂය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) වෙනත් ලැබිය යුතු ණය | 1,000,000 | ශේෂ සනාථන හා කාල විශ්ලේෂණ | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් වලට අදාළ ප්‍රමාණවත් හා යෝග්‍ය විගණන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) ආපසු ලැබිය යුතු තැන්පතු | 1,278,403 | | | |
| (ඇ) වෙළඳ ණයහිමියෝ | 547,505 | | | |
| (ඈ) වෙනත් ණයහිමියෝ | 533,464 | | | |
| (ඉ) ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ල | 41,720,741 | හිමිකම් ඔප්පු | | |
| (ඊ) බැද්දේගාන ගොඩනැගිල්ල | 29,521,436 | | | |
| (උ) ස්ථාවර වත්කම් | 105,522,883 | භෞතික සත්‍යාපන වාර්තා | | |
| (ඌ) රඳවාගත් අරමුදල් | 4,582,669 | විස්තරාත්මක උපලේඛන | | |

## 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 වර්ෂයේ සිට පැවත එන රු.12,489,521 ක් වූ ශේෂ 05 ක් අයකර ගැනීම සඳහා සම්මේලනය විසින් කටයුතු කර නොතිබුණි. | 2019 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ලැබිය යුතු ශේෂයන් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. අයකර ගත නොහැකි ශේෂයන් සම්බන්ධයෙන් විධායක සභාවේ අනුමැතිය මත සුදුසු පියවර ගත යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 වර්ෂයේ සිට පැවත එන රු.573,464 ක් වූ ණයහිමි ශේෂ 02 ක් හා 2017 වර්ෂයේ සිට පැවත එන රු.18,206,454 ක් වූ ණය හිමි ශේෂ 06 ක් නිරවුල් කිරීමකින් තොරව ඉදිරියට ගෙන එමින් පැවතුණි. | 2019 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ගෙවිය යුතු ශේෂයන් අප්‍රමාදව නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂ ඇතුළුව 2018 දෙසැම්බර් 31 දිනට සම්මේලනය විසින් ක්‍රීඩා තරඟාවලි සහ ක්‍රීඩා සම්මන්ත්‍රණ පැවැත්වීම සඳහා තරග සංවිධායකවරුන්ට ලබාදී තිබුණු අත්තිකාරම්වල එකතුව රු.2,252,067 ක් විය. නියමිත කාර්ය අවසන්වූ පසු අත්තිකාරම් පියවා ගැනීමට සම්මේලනය විසින් කටයුතු කර නොතිබුණු අතර ලබාදිය යුතු උපරිම අත්තිකාරම් මුදල තීරණය කිරීම හා අත්තිකාරම් ලේඛනයක් පවත්වා ගෙන යාමද සිදුකර නොතිබුණි. | අවස්ථාවෝචිතව උපරිම අත්තිකාරම් මුදල වෙනස්වන අතර එය පියවීම සඳහා නිශ්චිත කාලවකවානුවක් ලබා දීම 2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ. | නියමිත කාර්යය අවසන් වූ පසු අප්‍රමාදව අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.5,775,153 ක් අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.31,938,592 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.26,163,439 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට මෙහෙයුම් වියදම් රු.76,181,635 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 අනුපාත විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපෙක්ෂව සමාලෝචිත වර්ෂයේදී ජංගම අනුපාතය 2.32 සිට 2.69 දක්වා වර්ධනය වී තිබුණි. ඒ අනුව සම්මේලනයේ කෙටි කාලීන බැරකම් පියවීමේ හැකියාව ඉකුත් වර්ෂයට සාපෙක්ෂව වර්ධනය වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------------

### 3.1 ප්‍රසම්පාදන කළමනාකරණය

-----------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව සම්මේලනය විසින් 2018 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් හා ප්‍රසම්පාදන කාලරාමුවක් සකස් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ සමාලෝචිත වර්ෂය තුළ රු.2,725,671 ක් වූ ප්‍රසම්පාදනයන් සිදුකර තිබුණු අතර ඒ සඳහා ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන්ට අනුව ප්‍රසම්පාදන කටයුතු සිදුකර නොතිබුණි. | මේ වන විට පාපන්දු සම්මේලනයේ මිලදී ගැනීම් පටිපාටියක් ක්‍රියාත්මකවන අතර 2020 වර්ෂයේ සිට ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කරනු ලැබේ. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන්ට අනුව මිලදී ගැනීම් සිදු කළ යුතුය. |